**ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

01. අංක 03 (01) 2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන දිනට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු ගුරුභවතුන්ට සහ නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

(අ) ඉල්ලුම් කරන ලද විෂය උපාධියට හෝ ඩිප්ලෝමාවට හදාරා තිබීම සහ එම විෂයට අදාළව ගුරුවරයෙකු ලෙස විධිමත් පත්වීමක් ලබා තිබීම.

(ආ) අ.පො.ස. (සා/පෙළ) (10, 11 ශ්‍රේණිවලට) ගුරුවරයෙකු ලෙස ඉගැන්වීමේ කටයුතු වල නිරතවීම හෝ නිලධාරියෙකු ලෙස අ.පො.ස. (සා/පෙළ) විෂය නිර්දේශවලට අදාළ රාජකාරිවල නිරතවීම.

1.2 අංක 10 සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරන ලද විෂයට අදාළ සුදුසුකම් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එසේ සඳහන් කිරීමට අපොහොසත්වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.3 අංක 13 සහ 14 ජේද සම්පූර්ණ කිරීමේ දී "ඔව්" හෝ "නැත" යන්න අදාළ කොටුව තුළ පැහැදිලිව සටහන් කරන්න. එසේ සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* දිනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූ අයකු නම් හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.

1.4 ඔබගේ පවුලේ සාමාජිකයෙකු විභාගයට ඉදිරිපත් වේ නම් ඒ බව අනිවාර්යයෙන්ම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.
පවුලේ සාමාජිකයකු යනුවෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ ඔබගේ හෝ කලත්‍රයාගේ සොයුරු සොයුරියන් හෝ ඔවුන්ගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ වේ.

**1.5 ඉල්ලුම්පත්‍ර යොමුකල හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. රජයේ පාසල් ගුරුවරුන්ගේ ඉල්ලුම් පත්‍ර මාර්ගගත ක්‍රමයට (Online) විදුහල්පති විසින් නිර්දේශ කර මාර්ගගත ක්‍රමයට (Online) මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුයි. මීට අමතරව මෙම ආකෘතියේ 16 ඡේදය හැර මාර්ගගත ක්‍රමයට (online) සම්පූර්ණ කල අයදුම්පතෙහි PDF පිටපත බාගත කරගෙන (Download) විදුහල්පතිට / ආයතන ප්‍රධානියාට භාරදිය යුතුය. එම දෘඪ පිටපත් විදුහල්පති හෝ ආයතන ප්‍රධානියා විසින් සහතික කර දෙපාර්තමේන්තුවට එවිය යුතුයි. (තවක අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර සමඟ සහතික කරන ලද ඇමුණුම් සියල්ල එවිය යුතුය.)**

**1.6 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන පහත දක්වා ඇති ස්ථානවල පිහිටුවීමට යෝජිත ය. (ඇගයීම් කාලසීමාව දින 14 ක් පමණ වේ.)**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. කොළඹ | 10. කළුතර | 20. බදුල්ල | 29. හම්බන්තොට | 38. කෑගල්ල | 47. අම්පාර | 56. පුත්තලම |
| 02. මහරගම | 12. මීගමුව | 21. වැලිමඩ | 30. කුරුණෑගල | 39. පේරාදෙණිය | 48. කල්මුණේ | 58. වැල්ලවාය |
| 03. හෝමාගම | 13. ගම්පහ | 22. මහියංගනය | 31. නිකවැරටිය | 40. ගම්පොළ | 49. අක්කරෙයිපත්තු | |
| 04. පිළියන්දල | 14. නිට්ටඹුව | 23. අම්බලන්ගොඩ | 32. කුලියාපිටිය | 41. මහනුවර | 50. මඩකලපුව | |
| 05. මොරටුව | 15. රත්නපුරය | 24. ඇල්පිටිය | 33. හලාවත | 42. මාතලේ | 51. වව්නියාව | |
| 06. හංවැල්ල | 16. පැල්මඩුල්ල | 25. ගාල්ල | 34. කැකිරාව | 43. තෙල්දෙණිය | 52. මන්නාරම | |
| 07. අවිස්සාවේල්ල | 17. ඇඹිලිපිටිය | 26. ඇකුරැස්ස | 35. අනුරාධපුරය | 44. නුවරඑළිය | 53. යාපනය | |
| 08. හොරණ | 18. බලංගොඩ | 27. මාතර | 36. පොළොන්නරුව | 45. හැටන් | 54. තෙල්ලිපළයි | |
| 09. පානදුර | 19. බණ්ඩාරවෙල | 28. තංගල්ල | 37. ත්‍රිකුණාමලය | 46. මොනරාගල | 55. කිලිනොච්චිය | |

**සැ.යු. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද සඳහන් කළ යුතුය.**

1.7 පත්වීම දෙනු ලබන්නේ පෞද්ගලික හෝ රාජකාරි ලිපිනයට ආසන්නතම ඇගයීම් මධ්‍යස්ථානවලට ය. එම මධ්‍යස්ථානයේ අදාළ විෂයට ඇගයීම් මණ්ඩල නොමැති නම් හෝ ප්‍රමාණවත් පුරප්පාඩු සංඛ්‍යාවක් නොතිබේ නම් හෝ වෙනත් ආසන්න ඇගයීම් මධ්‍යස්ථානයකට යොමු කෙරේ.

02. **සහතික කරන නිලධාරියා**

ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති විසින් ද, කලාප කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද කොට්ඨාස කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා විසින්ද සහතික කළ යුතු ය.

03. **සහතික කරන නිලධාරියාට උපදෙස්**

3.1 අයදුම්කරු මෙම ආකෘතියේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි ඔබ විසින් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

3.2 ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කළ යුතුය.

3.3 ඉහත අංක 16 (a) (i) සිට (iv) දක්වා ඇති කරුණු යටතේ අයදුම්කරු පිළිබඳ ව ඔබේ තක්සේරුව අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දැක්විය යුතුය.

**A - විශිෂ්ටයි B - හොඳයි C - සාමාන්‍යයි W - දුර්වලයි**

3.4 මෙය රහස්‍ය වාර්තාවකි. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛනගත කර අදාළ ඇමුණුම් ද සහිතව ඡායා පිටපතක් තම කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතුය. සියලුම අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර වල මුල් පිටපත ඇමුණුම් ද සහිතව, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර අ.පො.ස. (සා/පෙළ) විභාගය - 2023(2024)**" ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

සියලුම අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2024.03.22 බව සලකන්න.

විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග (ඇගයීම්) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.